# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,913 — 1964 ජනවාරි 10 වැනි සිකුරාද — 1964.1.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 25 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 28 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 29 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 44 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 45 | විවිධ දැන්වීම් ... ... ... | 46 |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම්වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේදී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අකුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම් සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන්ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

---

## විශෙෂ නිවේදනයයි

1964 ජනවාරි මස 14 වැනි අඟහරුවාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1964 ජනවාරි 17 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1964 ජනවාරි 11 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1964 ජනවාරි 3 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

(iii) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු පත් කළ දින සිට වැටුපෙන් සියයට 4 බැගින් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

5. මෙම ගැසට් පත්‍රයෙහි I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ පටන් ගැනීමේ පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩී. ඇම්. හෙට්ටිආරච්චි,
වැ. බ. අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය : ගුවිඑ. 4198,
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කොළඹ 2, ජනවාරි මස 1, 1964.

## ආදර්ශ පෝර්මය

**රජයේ ගුරු විද්‍යාලයන්හි පුස්තකාලයාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. 1964.2.1 වැනි දිනට නිවැරදි වයස : අ.————, මාස.————, දින :————.
4. ජාතිය හා එය ලද අන්දම :————.
5. උපන් ස්ථානය—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඔහුගේ පියා :————.
   (ඉ) ඔහුගේ පියාගේ පියා :————.
   (ඊ) ඔහුගේ පියාගේ පියාගේත් පියා :————.
6. ලබාගත් දින සමග අධ්‍යාපනික සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යාපන සහතික පත්‍රවල පිටපත් ඇමිණිය යුතුයි) :————.
7. වෘත්තීය සුදුසුකම් :————.
8. ඉගෙනීම ලැබූ පාසැල හා විද්‍යාල (ඇතුලත් වූ හා අස් වූ දින සඳහන් කළ යුතුයි.) :————.
9. දැනට යෙදී සිටින රක්ෂාව :————.
10. ඉගැන්වීමේ පළපුරුද්ද : (මෙහි පහත දැක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ නම | ඇතුළතවූ දිනය | අස්වූ දිනය | දැරූ තනතුර | සේවා කාලය අ. මාස දින | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

මුළු ගණන

11. සිංහල ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලබා ඇති සුදුසුකම් :————.
12. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත්, මුල් පිටපත් නොවේ, ඇමිණිය යුතුය. රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය) :—
13. වෙනත් සුදුසුකම් :————.

ම විසින් ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුවහොත්, කිසිම වන්දි ගෙවීමක් නොමැතිව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත්වන බව ද මම දනිමි.

————————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–245—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### දෙවන පෙළ ජේලර් තනතුරු

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දෙවන පෙළ ජේලර් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර තම අත් අකුරින්ම පුරවා 1964 ජනවාරි 25 වන දිනට හෝ ඊට පෙර හෝ මෙම කාර්යාලයට ලැබෙන සේ "බන්ධනාගාර කොමසාරිස්, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 9" යන ලිපිනයට එවිය යුතුයි.

**ස. ල.**—ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "දෙවන පෙළ ජේලර් තනතුරු සඳහා ඉල්ලුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුයි. ඉල්ලුම් පත්‍ර ලැබුණු වග දැනුම් දෙනු නොලැබේ.

2. **වැටුප්.**—රුපියල් 1,740 න් පටන් ගෙන රු. 120 සේ වාර්ෂික වැඩිවීම් 17කින් රු. 3,780 දක්වා වැඩිවෙන වැටුපක් මෙම තනතුරට හිමි වේ. රු. 2,820 ට පැමිණීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු සහ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ අරමුදලට දායක විය යුතුයි.

4. **සේවා කොන්දේසි.**—(අ) පත්වීම තුන් අවුරුද්දක පරීක්ෂාවට භාජන වේ.

(ආ) තෝරා පත් කරගත් අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

(ඇ) තෝරාගත් අපේක්ෂකයා සියලුම දෙපාර්තමේන්තු විභාග වලින්, නියමිත කාලසීමාව තුළදී සමර්ථ විය යුතුයි. ඔහු දෙපාර්තමේන්තුවේ සෑම ආයතනයක් තුළම සේවය සඳහා පත් කිරීමට ඉඩ තිබෙන අතර, ඒ ඒ ආයතනයන්වලදී ඔහුට භාර කරන වැඩ කටයුතු ඉටු කළ යුතුයි.

(ඇ) පරීක්ෂා කාලය ඇතුළත, ඔහු තවදුරටත් සේවයෙහි රඳවා ගැනීමට නුසුදුසු යැයි මෙහි පහත අත්සන් කරන්නාට හැඟේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) ලාංකිකයෙකු වීම,

(ආ) 1964 ජනවාරි 25 වන දිනට අවුරුදු 21ට නොඅඩු හෝ අවුරුදු 30ට නොවැඩි විය යුතු බව,

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ලබා ඇති බව,

(ඇ) මහා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුයි. අඩුම වශයෙන් උස අඩි 5, අඟල් 4ක් ද, පපුවේ සාමාන්‍ය පළල අඟල් 32ක් ද විය යුතුයි.

(ඉ) සමාජ සේවා වැඩ පිළිබඳ පුහුණුවක් හෝ සුදුසුකම් ඇති අපේක්ෂකයින් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතික පිටපත් පමණක් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය ;

(ඇ) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත් 3ක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

8. මෙම නිවේදනයේ ප්‍රකාර නොවන සියලුම අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1964 ජනවාරි මස 4 දින,
කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දීය.

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ජේලර් තනතුර සඳහා ඉල්ලුම් කිරීම

(ස.ල.—එවිය යුත්තේ සහතිකවල පිටපත් මිස මුල් සහතික නොවේ. එවනු ලබන සහතික ආපසු නොඑවනවාත් හැර තැපෑලේදී නැතිවන සහතික ගැන දෙපාර්තමේන්තුව වගකියන්නේ ද නැත.)

1. සම්පූර්ණ නම :—
   නම :————.
   වාසගම :————.
2. ස්ථිර ලිපිනය :————.
3. උපන් දිනය හා 64.1.25 වැනි දිනට වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. පියාගේ නම හා රක්ෂාව :————.

5. උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ පියා :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. (අ) ජාතිය :—

(ආ) ඔබ ලාංකිකයෙක් ද යන වග :————.

(i) උප්පත්තියෙන් ද :————.

(ii) නැත් නම් ලියාපදිංචි කරවා ගැනීමෙන් ද :————.

7. කසාද බැඳලාද නැද්ද යන වග :————.

8. උස : අඩි...... අඟල්...... පපුවේ (සාමාන්‍ය) පළල : අඟල්.....

9. අධ්‍යාපන සුදුසුකම් (සම්මාන ලබා ඇති විෂයයන් දක්වන්න)—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

(ඇ) ඉංග්‍රීසි :————.

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

10. ක්‍රීඩා පිළිබඳ ඇති තත්ත්වය සහ පළපුරුද්ද පිළිබඳව විස්තර හා ආරක්ෂක හමුදාවක හෝ ස්වේච්ඡා සේවක භට හමුදාවක හෝ සේවය කළේ නම් දිනයන් ද ඇතුලු එම සේවයෙහි විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි) :————.

11. සමාජ සේවා පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද (සහතිකවල පිට පත් ඇමිණිය යුතුයි) :————.

12. දැනට රක්ෂාවක් තිබේ නම් එය :————.

13. චරිත සහතික දෙනු ලබන්නන්ගේ නම් හා ලිපිනයන් : ————.

14. පාසලින් අස්වූදා සිට කරන ලද රැකියාවන් (ස්වාමියාගේ නම, සේවය හා සේවා කාලය සඳහන් කරන්න. අපේක්ෂකයා රජයේ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර සැපයිය යුතුයි) :————

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–308—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහල ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩ-ඉම් (සිංහල) විභාගය—1963 ඔක්තෝබර්

1963 ඔක්තෝබර් 19 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ–ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| ගුණදස, වා.මී. (මහත්මිය) | ආගමන හා විගමන | සිංහල හා ලඝු ලේඛනය |
| ඩයස්, සෝ. (මහත්මිය) | නීති කෙටුම්පත්කරුගේ | සිංහල |

2. පහත සඳහන් අපේක්ෂිකාවන් සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දුන් සුදුසුකම් ලබා ඇත :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| ගුණදස, වා.මී. (මහත්මිය) | ආගමන හා විගමන |
| ඩයස්, හෝ (මහත්මිය) | නීති කෙටුම්පත්කරුගේ |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩ-ඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරිණියන්ද, එම පරීක්ෂණයට ඇතුළු වීම සඳහා සුදුසුකම් මීට කලින් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළු වීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහා ම ඉල්ලා සිටිය යුතු ය.

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

1964 ජනවාරි 3 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

1–281/1—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1 (ජී).

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන් සඳහා 1963 ඔක්තෝබර් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (සිංහල) විභාගය

1963 ඔක්තෝබර් 19 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත්ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන්/ලඝු ලේඛිකාවන්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| අභයපාල, කු. ශ්‍රේ. මේ. මැ. (මහත්මිය) | පොල් වැවීම හා නහා සිටුවීමේ | සිංහල |
| අයිරාංගනී, බු.පැ. (මෙනෙවිය) | සමුපකාර සංවර්ධන | සිංහල |
| අල්විස්, ගු.ස.ක. (මෙනෙවිය) | වරාය කොමිෂන් සභා කාර්යාලය | ලඝු ලේඛනය |
| කරුණාරත්න, ලේ.ව. (මහත්මිය) | ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත | සිංහල හා ලඝු ලේඛනය |
| නානායක්කාර, පී. | නුවරඑළිය කච්චේරිය | ලඝු ලේඛනය |
| පෙරේරා, ඉ. ඇ. එ. ෆී. (මෙනෙවිය) | විදුලි සංදේශ පාලක කාර්යාලය | ලඝු ලේඛනය |
| වර්ණසූරිය, ශ්‍රීමා (මෙනෙවිය) | රාජ්‍ය භාෂා | ලඝු ලේඛනය |
| වික්‍රමසිංහ, සෝ. (මෙනෙවිය) | රජයේ වැඩ හා තැපැල් අමාත්‍යාංශය | සිංහල |
| සූරිය–ආරච්චි, දෝ. හේ. (මහත්මිය) | පළාත් පාලන හා ස්වදේශ අමාත්‍යාංශය | ලඝු ලේඛනය |
| හෙට්ටිගොඩ, සු. (මහත්මිය) | කම්කරු | සිංහල |
| ලීලාවතී ද. හේ. (මෙනෙවිය) | මහා භාණ්ඩාගාරය | සිංහල |

2. පහත සඳහන් නිලධාරීහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දන් සමර්ථ වී ඇත්තාහ :—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| අල්විස්, ශු. ස. ක. (මෙනෙවිය) ... ... ... | වරාය කොමිෂන් සභා කායඹාලය |
| කරුණාරත්න, ලේ.ව. (මහත්මිය) ... ... ... | ග්‍රාම සංවර්ධන හා සුළු කර්මාන්ත |
| නානායක්කාර, පි. ... ... ... ... | නුවරඑළියේ කච්චේරිය |
| පෙරේරා, ඉ. ඇ. එ. ෆි. (මෙනෙවිය) ... ... ... | විදුලි සංදේශ පාලක කායඹාලය |
| වර්ණසූරිය, ශ්‍රීමා (මෙනෙවිය) ... ... ... ... | රාජ්‍ය භාෂා |
| සූරිය–ආරච්චි, දෙද්. හේ. (මහත්මිය) ... ... ... | පළාත් පාලන හා ස්වදේශ අමාත්‍යාංශය |
| ලීලාවතී , ද. හේ. (මෙනෙවිය) ... ... ... | මහා භාණ්ඩාගාරය |

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩ බලන නියෝජ්‍ය ලේකම්.

1964 ජනවාරි 3 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

1–281/2—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/11(ජී).

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය—1962 ජූනි

අංක 13,778 හා 1963.10.4 වැනි දින දරන, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ 1963.9.24 වැනි දින දරන නිවේදනයට වැඩිමනත් වශයෙනි. 1962 ජූනි 30 වැනි දින පවත්වන ලද යතුරු ලේඛන සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නාම් සඳහන් අපේක්ෂක, අපේක්ෂිකාවන් ද යතුරු ලේඛක සේවයට පත් කිරීමට තෝරා ගෙන ඇති බැව් මෙයින් දැනුම් දෙමි.

| නම | ලිපිනය |
|---|---|
| ආරියසේන සිල්වා, කු.තො.ප. ... | බේරුවල, බණ්ඩාරවත්තේ, 39/1. |
| කුසුමාවතී, ප.වි. (මෙනෙවිය) ... | අගලවත්තේ, තෙන්නකෝන් වත්ත. |
| ද සිල්වා, ඉ. (මෙනෙවිය) ... | මාතර, තොටමුණ, ජයමහ විහාර පාර. |
| පද්මිණී අබේසේකර, දි.ආ. (මෙනෙවිය) | කොළඹ 1, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පරිවර්තන ශාඛාව. |
| පියසීලි, ශු.දො. (මෙනෙවිය) ... | අවිස්සාවේල්ලේ, ආරාධනා කන්දේ, 1. |
| පේමරත්න, කා.හ.ග. ... | මිතියාගොඩ රොත්නදූවේ, "ශ්‍රී විජය". |
| පේමවතී, දි. (මෙනෙවිය) ... | කොටුගොඩ, නැදගමුව. |
| ප්‍රනාන්දු, කු.ජෝ.ප්‍රා. ... | හලාවත, "දිමුතු" වාණිජ විද්‍යාලය. |
| ප්‍රනාන්දු, දෙ.ස. ... | ජා-ඇල, කුඩහකපොල, අංක 64. |
| ප්‍රනාන්දු, ව.රි.පැ. (මෙනෙවිය) ... | ජා-ඇල, කුඩහකපොල උතුර, අංක 96. |
| රත්නම්, ශ්‍රි. (මෙනෙවිය) ... | කොළඹ 10, මරදානේ, ජේස්බස් ලේන්හි, අංක 75/11. |

කු. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ වැඩබලන නියෝජ්‍ය ලේකම්.

1964 ජනවාරි 4 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දීය.

1–307—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ශිෂ්‍ය දත් හෙදියන්ගේ විභාගය—1964 මාර්තු 28

ඉහත සඳහන් පරීක්ෂණයේ 9 වැනි ඡේදය පහත සඳහන් අයුරු විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

9. විභාග පරිපාටිය පහත දැක්වේ.

(අ) භාෂාව හා රචනය (සිං. හෝ දෙ. හෝ ඉං.) පැය 1 යි. ... 100

(ආ) සාමාන්‍ය හා ප්‍රාදේශී දැනුම (සිං. හෝ දෙ. හෝ ඉං.) පැය 1 යි. ... 100

(ඇ) අංක ගණිතය—(සිං. හෝ දෙ. හෝ ඉං.) පැය 1 යි. ... 100

(ඇ) සම්මුඛ පරීක්ෂණය ... 200

2. අංක 13,901 හා 64.1.3 දින දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ 9 වැනි පිටුවෙහි ඇති සිංහල ප්‍රකාශනයෙහි 9 වැනි ඡේදය අවලංගු වූ ලෙස සලකන්න.

බී. කේ. ද සිල්වා,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 500, කොළඹ 1.

1–334—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## 1964 මාර්තු මස 1 වැනි දින සිට 1964 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කොළඹ (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය) බන්ධනාගාරවලට කෑම ද්‍රව්‍ය සැපයීම

කොළඹ (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය) බන්ධනාගාරවලට වර්ෂ 1964 මාර්තු මස 1 වැනි දින සිට වර්ෂ 1964 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ.

2. සැපයිය යුතු ද්‍රව්‍ය ටෙන්ඩර් පෝර්මයේ "ඉ" උපලේඛනයේ සඳහන් කුළුබඩු වර්ග වේ. මෙම උපලේඛනයේ සියළුම වර්ග සඳහාම ටෙන්ඩර්කරුවන් විසින් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක දමා, සිල් තබා, "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, අධිකරණ අමාත්‍යාංශය" කියා එවිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරී තැන්පත් ජී. එල්. ඩබ්ලිව්. දහනායක මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ "කොළඹ බන්ධනාගාරවලට "ඉ" උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා 1964.1.31 දින පෙරවරු 10.30 ට ප්‍රථම අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාට ලැබෙන සේ එවිය යුතුය. ටෙන්ඩර්කරුවනට වුවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. එදිනම කොළඹ 12, අධිකරණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්තැනගේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුය.

9. ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල වන රු. 100 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හා පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල වන රු. 300 ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් විනි නම්, එසේ නොගොස් එසේ කිරීමෙන් වැලකී සිටී නම්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධව කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකි වන සේ, ඔහු ගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන් ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුට සිදුවෙනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාරදුනහොත් එම නිවේදනය ලැබුන ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛනය සඳහා තැන්පත් කරනු ලබන මුදල වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරන මිල ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම එම ගණන් වචන යෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන වගට ඔවුන් වෙනුවෙන් ඇපකරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති විශ්කිව යුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට සුදුසු ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍ය ය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ සඳහන්ය.

13. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියළුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ සම්පූර්ණ යෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක්, වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළි නොගෙන ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම්, කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමෙකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ, ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක්, ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේ දී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම් දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද රිපෝර්තුවක් එවිය යුතුය. දේපොළ විස්තර ද සඳහන් කළ යුතුය.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්කරුවන් එසේ කොන්ත්‍රාත් කරන ලද්දේ නම්, ඒ ඒ පළාත් හෝ දිස්ත්‍රික් හෝ සඳහන් කළ යුතු ය.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුය. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නා වූ නිලධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියාද වේ.

19. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇෆ්. ඞී. ඇල්. රත්නායක,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

1964.1.3.
කොළඹ, 9, බන්ධනාගාර මූලස්ථානයේ දීය.

1–349—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ 9, වැලිකඩ බන්ධනාගාරයේ හිස් ගෝනි, බෝතල, ටින් යනාදිය මිළට ගැනීම

කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ, වැඩබලන බන්ධනාගාර කර්මාන්ත අධිකාරි විසින් පහත සඳහන් ද්‍රව්‍යයන් මිළයට ගැනීම සඳහා කැමැත්තවුන් ගෙන් 1964 ජනවාරි මස 31 වෙනිදා පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | හිස් ඝන ගෝනි මලු | ... ... 250 |
| 2. | හිස් තුනී ගෝනි මලු | ... ... 300 |
| 3. | හිස් විනාකිරි බෝතල | ... ... 150 |
| 4. | හිස් (ගැලුම් 4 රේ) ටින් | ... ... 140 |
| 5. | හිස් (රාත්තලේ) ඊස්ට් ටින් | ... ... 500 |
| 6. | හිස් ජී. අයි. (හොණ්ඩරයේ) ටින් | ... 25 |
| 7. | හිස් (ගැලුම් 45 හේ) ලොකු ටින් | ... 10 |

2. ටෙන්ඩර් පෝර්ම සඳහා කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයෙහි රු. 25ක් තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන ලද රිසිට් පත ටෙන්ඩර් පතට ඇමිණිය යුතුයි. යම් ටෙන්ඩරයක් භාරගත් බව ලිපියකින් දන්වා දින හතක් (7) ඇතුළතදී එම ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට නොහැකි වී නම්, හෝ ඉවත්කර ගැනීමේ කාර්යය පැහැර හැරියේ නම් හෝ ටෙන්ඩර් පත් වෙනුවෙන් තැන්පත් කල මුදල රාජසන්තක කරනු ලැබේ. ටෙන්ඩර් පත පිළිගත් බව දන්වා යැවෙන ලිපිය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට යැවීනි නම් හෝ එම ස්ථානයෙහි තබා ආවේ නම් හෝ ටෙන්ඩර් කරුට සිය ටෙන්ඩරය පිළිගත් බවට දන්වා යැවුනු සේ සලකාගනු ලැබේ. පිළිගත් ටෙන්ඩර්කරු විසින් උක්ත ද්‍රව්‍යයන් ඉවත්කර ගැනීමෙන් පසුව තැන්පත් මුදල ආපසු දෙනු ඇත.

3. ටෙන්ඩර් කරුවන් විසින් දෙන්නට කැමති මිළ ගණන් එක් එක් ද්‍රව්‍ය තොගයක් සඳහා වෙන් වශයෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත් ලියුම් කවරයක බහා, වසා මුද්‍රා තබා පහත සඳහන් අයගේ ලිපිනයට ඉදිරිපත් කළ යුත්තේ ය. හැම කවරයකම වම්පස ඉහලම කොනේ "හිස් ගෝනි, විනාකිරි බෝතල ආදිය මිළයට ගැනීම සඳහා වූ ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කළ යුතුය. මේ සඳහාම පිළියෙල කොට ඇති පෝර්ම පහත සඳහන් කාර්යාල යෙන් ලබාගත හැකිය.

4. කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ බන්ධනාගාර කර්මාන්ත අධිකාරිගේ කාර්යාලයේදී 1964 ජනවාරි 31 දා පෙරවරු 10.35 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවනට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ කරුණ පිළිබඳව තවත් විස්තර අවශ්‍ය වේ නම්, පහත අත්සන් කරන අයගෙන් ඒ ලබාගැනීමට පිළිවන.

පො. කුමාරස්වාමි,
වැඩබලන බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

1964 ජනවාරි මස 3 වෙනිදා, කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේදීය.

1–344—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ අඩි සවිර කඳවුරට ජලය සැපයීම (ආර්.ඇල්. 1) සඳහා ටෙන්ඩර් පත් 1964.2.5 බදාදා පෙරවරු 11 දක්වා උ.මැ.කො. ප්‍රා.වා.ඉ. අනුරාධපුරය විසින් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවෙලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 45,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කල හැක.

3. 1964.1.31 වැනි දින තෙක් (එදින ඇතුලුව) කාර්යාලීය වේලාවන් තුලදී රාජාංගන ව්‍යාපාරයේ (තඹුත්තේගම) වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරමවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිණුම්, වැඩය පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

කො. සී. නී. ප්‍රනාන්දු,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
රාජාංගන ව්‍යාපාරය.

වාරිමාර්ග කායසීලය,
රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 63.12.31.

1–216—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

යාපනය උප කොටසේ අක්කරායම්කුලමේ දකුණු ඉවුර ප්‍රධාන ඇල පාරේ තුන්වන සැතපුමේ අඩි 330 ක ආවරණ වාන සම්බන්ධිත පැන්නුම් පාලමක් (Skin type spill cum causeway) තැනීම සඳහා ටෙන්ඩර්පත් 1964 පෙබරවාරි මස 11 වන අඟහරුවාදා පෙරවරු 10 දක්වා වව්නියාවේ, උතුරු කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් භාර ගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදුකෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 45,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කල හැක.

3. 1964 ජනවාරි මස 20 වන සඳුද සිට 31 වන සිකුරාදා වන තෙක් කායසීලීය වේලාවන් තුලදී කිලිනොච්චියේ, යාපනය උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීලයෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට පෙර රුපියල් පණහක (රු. 50) ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය පිළිබඳ සියළුම වැඩි විස්තර කායසීලීය වේලාවන් තුලදී ඉහතකී වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීල යෙන් ලබාගත හැක.

අ. වෙල්ලප්පා,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
යාපනය උප කොටස.

1–304—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මින්නේරිය උප කොට්ඨාශය

ගිරිතලේ ඇලහැර පාරට ගල් දමා තාර දැමීම සඳහා ටෙන්ඩර් පත් 1964 පෙබරවාරි මස 6 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 දක්වා පොළොන්නරුවේ ඊශාන කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්මේන්තුවේ රුපියල් 23,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවනට පමණක් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1964 ජනවාරි මස 31 වෙනි සිකුරාදා වන තෙක් (එදින ඇතුළුව) කායසීල වේලාවන් තුළදී හිඟුරක්ගොඩ මින්නේරිය වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීලයෙන් ලබාගත හැකි පෝර්මවලින් ටෙන්ඩර් අයදුම් පත් සකස්කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද, නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායසීලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩ පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ගෝ. මී. දො. මු. ගුණරත්න,
වාරිමාර්ග ඉංජිනේරු,
මින්නේරිය උප කොටස.

හිඟුරක්ගොඩ,
1964 ජනවාරි මස 4 වැනි දින.

1–305—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මෙහි පහත දැක්වෙන ද්‍රව්‍යයන් ඒ ඒ ගොවිපල් කරා ගෙන ගොස් භාරදීම සඳහා, කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලනය හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1964.1.24 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

1. පොලොන්නරුවේ සත්ව ගොවිපලට පොල් අතු 25,000 යි.
2. පොලොන්නරුවේ සත්ව ගොවිපලට පිදුරු ටොන් 60 යි.
3. කුණ්ඩසාලේ කුකුල් මධ්‍යස්ථානයට අඟල් බාගේ ලෑලි හතරැස් අඩි 20,000 යි. (කොට්ට ලෑලි වැනි සැහැල්ලු, පැටවූ පෙට්ටි සෑදීමට සුදුසු ලෑලි වර්ගයකින් සැපයිය හැකියි).

1. පොල් අතු—දිගින් අඩි 5 කට නොඅඩුවූ ඉරු දෙකේ පොල් අතු.
2. පිදුරු—මනාසේ වේලුනු ගොයම්-පිදුරු, රාත්තල් 5 හේ පමණ මිටි වලින් සැපයිය යුතුයි.
3. අඟල් බාගේ ලෑලි—කුකුල් පැටවූ යැවීමට අවශ්‍ය පෙට්ටි සෑදීමට සුදුසු කොට්ට ලෑලි වැනි ඉතා සැහැල්ලු වර්ගයක ලෑලි සැපයිය හැකියි.

2. පෝර්ම කොළ කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලනය හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලනය හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, තැ. පෙ. 536, කොළඹ 1," යන්න ලියා එහිම මුදුනේ වම් කොනේ (ගොවිපලේ නම සහ සපයන ද්‍රව්‍යයේ නම) සැපයීම" යන්න ලියා එවිය යුතු යි.

3. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු යි. 1964 ජනවාරි මස 24 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. මේ තැන්පත් කිරීම පේරාදෙනියේ සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයේදී කළ යුතු යි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා, දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නො හැකි වුවහොත්, ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ

9. ශිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන සේ ස්ථිර ඒවා විය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්‍ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ රට වැසියෙක් වූ තැනැත්තෙක් ය යන්නයි.

13. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සළකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඒ. ටී. ඇම්. සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙනියේ දීය, 64.1.3.

1–325—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිස් ගෝනි විකිණීම

සත්ව පාලනය හා සෞඛ්‍ය අංශයේ ගොවිපල්වල ඇති හිස් ගෝනි විකිණීම සඳහා, කොළඹ, සත්ව පාලනය හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1964 ජනවාරි මස 24 වැනි දින පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. එක ගෝනියකට ගෙවන මිල හෝ තොග වශයෙන් ගැණීමේදී ටොන් එකකට හෝ හොණ්ඩරයකට ගෙවන මිල ටෙන්ඩර් ෆෝර්මයේ සඳහන් කළ යුතුයි. තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු 1964.1.1 වැනි දින සිට 1964.9.30 වැනි දින දක්වා ඒ ඒ ගොවිපලින්, මාසයකට වරක් (සෑම මාසයේම 15 වැනි දිනට පෙර) මේ හිස් ගෝනි මිලදී ලබාගත යුතුයි. සාමාන්‍යයෙන් ගොවිපල්වලින් මාස්පතා ලබාගත හැකියයි බලාපොරොත්තු වන ගෝනි ගණන් මෙහි පහත දක්වේ :—

| | | | කිට්ටු දුම්රියපොල |
|---|---|---|---|
| 1. | බෝපත්තලාව සත්ව ගොවිපල | 2,000 | තලවකැලේ |
| 2. | රිදියගම සත්ව ගොවිපල | 1,500 | අම්බලන්තොට |
| 3. | පොළොන්නරුව සත්ව ගොවිපල | 1,250 | පොළොන්නරුව |
| 4. | අඹේවෙල සත්ව ගොවිපල | 1,000 | අඹේවෙල |
| 5. | වැලිසර සත්ව ගොවිපල | 1,000 | රාගම |
| 6. | උඩුගොඩ රජයේ කිරි පට්ටිය | 300 | පොල්ගහවෙල |
| 7. | කන්දකාඩුව සත්ව ගොවිපල | 200 | වැලිකන්ද |
| 8. | කුණ්ඩසාලේ කුකුළ් මධ්‍යස්ථානය | 100 | මහනුවර |
| 9. | කොටුකච්චිය එළුවන් ගොවිපල | 100 | පුත්තලම |
| 10. | කරගොඩ-උයන්ගොඩ සත්ව ගොවිපල | 175 | මාතර |
| 11. | වීරවිල කපු බීජ මධ්‍යස්ථානය | 100 | තිස්සමහරාමය |
| 12. | නිකවැරටිය සත්ව ගොවිපල | 60 | මාහෝ |
| 13. | කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානය | 50 | මහනුවර |
| 14. | යාපනේ, තින්නවැලියේ කෘතිම සිංචන මධ්‍යස්ථානය | 50 | යාපනය |
| 15. | මාරාවිල සත්ව ගොවිපල | 300* | නාත්තන්ඩිය |

(*මෙ ගොවිපලේ ඇත්තේ ගෝනි 300 ක් පමණයි. ඒවා එකවරම ලබාගත හැකියි)

3. ගොවිපල් සියල්ලටම හෝ එක් එක් ගොවිපලට වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉල්ලුම්පත් එවිය හැකියි. එහෙත් එක් එක් ගොවිපල වෙනුවෙන් රු. 10 බැගින් තැන්පත් කර ලබාගත් කුවිතාන්සි හෝ කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන්, කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයෙන් ටෙන්ඩර් ආකෘති ලබාගත යුතුයි. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ දවල් 12 වනතුරු ටෙන්ඩර් ආකෘති නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ඉල්ලුම් පත් ලියාපදිංචිකර, පිටපත් දෙකම, නිසිසේ සම්පූර්ණකර, සීල් තබා, "සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලනය හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ල, ඩියුක් වීදිය, කොළඹ 1" යන ලිපිනයට ලියාපදිංචි කර එවිය යුතුයි. ලියුම් කවරයේ වම් කෙළවරේ (ගෝනි මිලට ගැණීමට බලාපොරොත්තු වන) ගොවිපලේ නම පැහැදිලිව ලියා, ඉල්ලුම්කරුගේ ලිපිනයද සඳහන් කරන්න.

5. තෝරාගත් කොන්ත්‍රාත්කරු ඒ බව දන්වා දින 10 ක් ඇතුළත කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකමෙන් සියයට 5 ක් ඇප වශයෙන් පේරාදෙනියේ, සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයේ තැන්පත් කොට පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. පොරොන්දු පත්‍රයට අත්සන් කරනු ලබන්නේ කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයේදීය. ඇප මුදල තැන්පත්කර පොරොන්දු පත්‍රයට අත්සන් කළ වහාම ගෝනි මිලට ගැණීම ආරම්භ කළ හැකිය. තම තමන් විසින් මිලදී ලබාගන්නා ලද ගෝනි දින 2 ක් ඇතුළත ගොවිපලෙන් අස්කර ගත යුතුයි.

6. ටෙන්ඩරයකින් කොටසක් පමණක් පිළිගැණීම හෝ සියල්ලම නිෂ්ප්‍රභකිරීමේ බලය රජය වෙත පැවරේ.

7. ලියාපදිංචිකර එවන ඉල්ලුම්පත් ලැබුණු බව එදිනම ටෙන්ඩර් කරුවන් වෙත දන්වනු ලැබේ. ඉල්ලුම්කරුවන් කැමති නම් ටෙන්ඩර් විවෘතකරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. කොළඹ ඉහත සඳහන් ස්ථානයේ පිහිටි සත්ව පාලනය හා සෞඛ්‍ය කාර්යාලයේදී එකී වේලාවට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

8. ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ පොරොන්දු පත්‍රයට අත්සන් කළ පසුයි. සම්කිසි විධියකින් නියමිත ඇප මුදල තැන්පත් නොකර හෝ පොරොන්දු පත්‍රයකට අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු කරනු නොලැබුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කර ඔහුගේ නම දෙපාර්තමේන්තුවේ වැඩ පැහැරහැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

9. කලින් නියම කරගත් දිනක ඉහත සඳහන් ගෝනි පරීක්ෂාකර බැලීමට ගොවිපලේ කළමනාකාරතැනගේ සහාය ලබාගත හැකියි. වැඩි විස්තර ඒ ඒ ගොවිපලේ කළමනාකාර තැනගෙන් දැනගත හැකියි.

10. ගෝනි තෝරා වෙන්කර ගැණීමට ඉඩ දෙනු නොලැබේ.

ඒ. ටී. ඇම්. සිල්වා,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1963.12.30 වැනි දින,
කොළඹ 1, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී.

1–218—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### ඉන්ටර්නැෂනල් වෑන් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන්

1964 ජනවාරි මස 24 වැනි සිකුරාදා පස්වරු 2 දක්වා කොළඹ 3, ගාළු මුවදොර, ධීවර අධ්‍යක්ෂ විසින් ඉන්ටර්නැෂනල් වෑන් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන් භාරගනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 25.

සී. ආර්. ඇල්. බාලසූරිය,
ධීවර අධ්‍යක්ෂ.

කොළඹ 3,
ධීවර දෙපාර්තමේන්තුව,
1963 දෙසැම්බර් මස 30 වැනිදා.

1–187—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ගිංගඟේ දකුණු ඉවුරේ පාරවල් සෑදීම සඳහා ටෙන්ඩර්

ඉඩම් වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත දැක්වෙන පාරවල් සෑදීම සඳහා ටෙන්ඩර් 1964 පෙබරවාරි මස 11 වැනි දින පෙ. ව. 10 තෙක් භාර ගනු ලැබේ :—

(අ) බඹරවාන-හිනිදුම පාර.

(ආ) පානගල-හබරකඩ පාර.

(ඉ) හත්තක-හබරකඩ පාර.

2. ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝරමයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. කොළඹ ගාලුමුවදොර මහා ලේකම් කායර්‍ාලයේ අංක 355 දරණ කාමරයේදී 1964.2.11 දින පෙ. ව. 10ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් හෝ ඔහුගේ නියෝජිතයින්ට පෙනී සිටිය හැක.

3. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ රු. 100,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම කායර්‍ාලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ ලංකා බැංකුවේ (යෝර්ක් වීදියේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ රු. 250ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් පරිදි ලියා පදිංචිය සහ පාරවල් හෝ ඊට සමාන වැඩ පිළිබඳ මනා පළපුරුද්දක් සහ එකී වැඩ සඳහා උචිතනා කායර්‍ මණ්ඩලයක් හා උපකරණ ඇති බවත් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඔප්පු කළ යුතුයි.

4. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විමසන්න.

සී. ද පොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

1964.1.2 දින,
ඉ.ස.දෙ. කායර්‍ාලයේ දීය.
කොළඹ.

1–333—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ පිහිටි කාසල් වීදියේ ආරෝග්‍යශාලාවේ ශල්‍යාගාරයට වායු සමන යන්ත්‍ර සැපයීම සහ පිහිටුවීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක්වූ මාර්තු මස 3 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්මවලයි. වර්ෂ 1964 ක්වූ පෙබරවාරි මස 28 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964ක්වූ මාර්තු මස 3 වන අඟහරුවාදා පූ. භා. 10ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඈම්. මුතුබාලසූරියර්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540, කොළඹ 10,
1964 ක්වූ ජනවාරි මස 10 දින දීය.

1–353—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## ගම්පහ රජයේ ආරෝග්‍යශාලාවේ ශල්‍යාගාරයට සහ ඊට අදාල කාමරවලට වායු සමන යන්ත්‍ර සැපයීම සහ භාරදීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1964ක්වූ මාර්තු මස 3 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා ඉඩම්, වාරිමාර්ග සහ විදුලිය පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ) විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලිය දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5 හේ මුදල ආපසු ගෙවනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් පෝර්මවලයි. වර්ෂ 1964ක්වූ පෙබරවාරි මස 28 වන දින අ. භා. 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වර්ෂ 1964ක්වූ මාර්තු මස 3 වන අඟහරුවාදා පූ. භා. 10ට ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ නො. 355 හේ කාමරයේ පිහිටි ඉඩම්, වාරිමාර්ග සහ විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට අවසර ඇත.

ඈම්. මුතුබාලසූරියර්,
වැඩ බලන විදුලි කර්මාන්ත ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540, කොළඹ 10.
1964 ක්වූ ජනවාරි මස 10 දින දීය.

1–351—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## රජයේ විදුලි දෙපාර්තමේන්තුව

**ගම් 50 හේ විදුලි ක්‍රමයේ ගම් 41 කට සම්ප්‍රේෂණ මාර්ග සහ බෙදා හැරීමේ උප පොලවල් සහ සේවා ඇමිනියන් පිහිටුවීමේ ටෙන්ඩරයයි**

63.10.4 සහ 63.11.22 දරණ ගැසට් පත්‍රවල පළවූ දැන්වීම් සම්බන්ධවයි. ඉහත සඳහන් ටෙන්ඩරය භාරගන්නා අවසාන දිනය 1964.1.21 වන දින පූ. භා. 10 දක්වා නැවත කල් දමා ඇති බව ටෙන්ඩර් අයදුම් කරුවන්ට මෙයින් දන්වා සිටිමි.

ඇම්. මුතුබාලසූරියර්,
වැඩ බලන ප්‍රධාන විදුලි අධිකාරී.

තැ. පෙ. 540,
කොළඹ, 64.1.10.

1–352—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්ත මේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

### සල් පිටිකෝරළේ (පිළියන්දල) ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය

(1) වෙනිවැල්කොල ගොවි මණ්ඩල ප්‍රදේශයේ රම්බර ඇල අමුණට ලෑලි, ඉබියතුරු, සැපයීම හා ජලදොර අළුත් වැඩියා කිරීම.

(2) දියගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ ගලගාව අංක 1 අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.

(3) දියගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ මහ ඇල අංක 2 අමුණ ප්‍රතිසංස්කරණය කිරීම.

### කොළඹ මුදලිතුමාගේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය (නුගේගොඩ)

(1) පාලගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ හෙරළියවල ගොඩවෙල අමුණට ලෑලි සැපයීම.

(2) පාලගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ මැසිල්ල කුඹුර අමුණට ලෑලි සැපයීම.

### හේවාගම් කෝරළේ (හෝමාගම)

(1) අංගොමුව ගොවි මණ්ඩල ප්‍රදේශයේ ඇල්ලෝවිට සහ මහ කුඹුර ජල දොරවල් 2 ක් තැනීම.

(2) අංගම්පිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ පිටුම්පේ දෙපාඇල අමුණ තැනීම.

### හෑගෙනහිර සියනෑකෝරළේ අදිකාරි පත්තුව (කඩවත)

(1) මීගහවත්ත ගොවි මණ්ඩල ප්‍රදේශයේ මීගහවත්ත හා රග්-ගහවත්ත අමුණුවලට ලෑලි සැපයීම.

(2) කරගහමුනුණ ගොවි මණ්ඩල ප්‍රදේශයේ සූරියපාලුව ජලදොර තැනීම.

(3) උඩුපිල ගොවි මණ්ඩල ප්‍රදේශයේ උඩුපිල අමුණට ලෑලි සැපයීම.

(4) දොරනාගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ අමුණු තුනක් අළුත් වැඩියා කිරීම.

(5) කරගහමුණ ගොවි මණ්ඩල ප්‍රදේශයේ මහර-නුගේගොඩ පිට ඇල ප්‍රතිසංස්කරණය කිරීම.

(6) හුණුපිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ ඇල මාර්ග දෙකක් ප්‍රති-සංස්කරණය කිරීම.

### දකුණු අළුත්කුරු කෝරළයේ (කඳාන)

1. කොටුගොඩ ගොවි මණ්ඩල ප්‍රදේශයේ වැටගස්පිටිය-ගල්ගම් එළිය නුගගේන ඇලමාර්ග සුද්ධ කිරීම.

(2) වැලිගම්පිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ කොස්ගහකුඹුර හා කහටගහවෙල හරස් පැන් නුම් දෙකක් තැනීම.

(3) වැලිගම්පිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ තුම්පැළියවල කහට ගහ වෙල ජලදොර තැනීම.

(4) බෝපිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ ජයසූරිය පාරේ අංක 2 බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම.

(5) බෝපිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ තුඩැල්ල පාරේ පමුණුගම බෝක්කු දෙකක් ප්‍රතිසංස්කරණය කිරීම.

(6) බෝපිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ නුගපේ බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම.

(7) බෝපිටිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ, ඇලමාර්ග හතරක් ප්‍රතිසංස්කරණය කිරීම.

(8) ඒකල දකුණ ගොවි මණ්ඩල ප්‍රදේශයේ මහවෙල්ල ප්‍රතිසංස්කරණය කිරීම.

### උතුරු අළුත්කුරු කෝරළයේ "ඒ" කොටස (මීගමුව)

1. පහලම්ඩම්පැල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ දළුපත්යාය ඇල පැතිබැම්ම බැඳීම.

### උතුරු අළුත්කුරු කෝරළයේ "බී" කොටස (මිනුවන්ගොඩ)

1. කෙහෙල්ඇල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ දෙල්ගහ කුඹුර කෝපිවත්ත අගර ඇල ජලදොර තැනීම.

2. කෙහෙල්ඇල්ල ගොවි මණ්ඩල ප්‍රදේශයේ බුලාන වෙල ජලදොර තැනීම.

3. කටුවැල්ලේගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ දික්වෙල කුඹුර ජලදොර තැනීම.

4. වීදියවත්ත උඩුගම්පොල ගොවි මණ්ඩල ප්‍රදේශයේ හැන්දිමහර අමුණ අළුත්වැඩියා කිරීම.

### බටහිර සියනෑකෝරළේ මැදපත්තුව (ඉඹුල්ගොඩ)

(1) බැලුම්මහර ගොවි මණ්ඩල ප්‍රදේශයේ පීල්ලගහකුඹුර අමුන තැනීම.

(2) මීවල ගොවි මණ්ඩල ප්‍රදේශයේ බරවදෙණිය වැව අළුත්වැඩියා කිරීම.

(3) වතුරුගම ගොවි මණ්ඩල ප්‍රදේශයේ අමුණු දෙකක් අළුත් වැඩියා කිරීම.

### හාපිටිගම් කෝරළයේ (මිරිගම)

(1) සියඹලාගොඩ ගොවි මණ්ඩල ප්‍රදේශයේ ජලදොරවල් තුනක් අළුත්වැඩියා කිරීම.

(2) ගස්පෙ-කොස්සැටදෙනිය ගොවි මණ්ඩල ප්‍රදේශයේ හල්පෙ ගිනිදැම්මන ඇලේ ගල් කැඩීම.

2 සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩර යක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1964 ජනවාරි මස 30 දින දවල් 12 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම් සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින් අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධන යක් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළයුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහ කාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ, උඩ, වම් කෙළවරේ "වැඩයේ නම සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1964 ජනවාරි මස 31 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරි තැන විසින් හෝ ලිය විල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්ක යේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධ යෙන් ගිවිසුමකට ඇතුළත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියේට 10ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් වියයුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන් හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

යූ ඩී. අයි. සිරිසේන,
මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

වර්ෂ 1964 ක්වූ ජනවාරි මස 1 දින,
මහනුවර, අධ්‍යාපන කාර්යාලයේදී ය.

1-259/1—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වර්ෂ 1964 වූ ජනවාරි මස 31 වැනි සිකුරාදා පෙරවරු 10.30 වනතෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මහනුවර, උප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩ |
|---|---|
| (1) මහ/දේදුනුපිටිය ම. වි. ... | පාසැල් ගොඩනැගිලි |
| (2) මහ/හිඟුල්වල ම. වි. ... | එම |
| (3) මහ/හරන්කහව සි. මි. පා. ... | එම |
| (4) මහ/කෙන්ගල්ල දෙමළ පාසැල | එම |
| (5) මහ/හපුකන්ද සි. මි. පා. ... | එම |
| (6) මහ/තැන්නේලන්ද සි. මි. පා. | එම |
| (7) මහ/හුරීකඩුව ගාමිණී විද්‍යාලය | එම |
| (8) මහ/දඟවිල සි. මි. පා. ... | එම |
| (9) මහ/හෙබ්බෙකන්ද සි. මි. පා. | විදුරු සැපයීම |
| (10) මහ/ගිනිගත්හේන ම. ම. වි. | වහල නැවත සෑදීම |

**සංලක්ෂ්‍යය.**—අංක 1. මහ=මහනුවර.
අංක 2. අවශ්‍ය ලියාපදිංචි කිරීම.

අංක 1 සිට 8—අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් 15,000 අනුමත කළ සමිති සමාගම් රුපියල් 15,000. අංක 9 සිට 10—අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව රුපියල් 10,000. අනුමත කළ සමිති සමාගම් රුපියල් 10,000.

2. ඉහත දැක්වෙන දෙවෙනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට සහ එහි සඳහන් මුදලකට නො අඩු ගණනකට ගොඩනැගිලි වැඩ සඳහා අධ්‍යාපන සහ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වූ විවිධ සේවා සමුපකාර සමිතිවලට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා කම්කරු සමිතිවලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජනවාරි මස 30 වැනි දින දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

3. ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්යාලයක හෝ එක් එක් වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක්ද තැන්පත්කොට ලබාගත් කුවිතාන්සි, මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනට ඉදිරිපත් කිරීමෙන් පසුව ය. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් (ගොඩනැගිලි ශාඛාවෙන්) හෝ මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත යුතුයි. මුදල් තැන්පත් කිරීමේ වව්චර් නිකුත් කරනු ලබන්නේ 2 වෙනි ඡෙදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවකු වශයෙන් ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. ඉහත සඳහන් 2 වෙනි ඡේදයන්හි දැක්වෙන පරිදි මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු මහනුවර අධ්‍යාපන උප අධ්‍යක්ෂතැනගෙන් දැනගත හැකි සි. සැලැස්මද එහිදී බලාගත හැකිය. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නො එවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රාතබන ලද ටෙන්ඩර් මහනුවර, අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර නිලධාරිතැනට භාරදී එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබාගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද, තමන් ඉල්ලා ඇති වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

6. වර්ෂ 1964 ජනවාරි මස 31 වැනි සිකුරාදා පෙරවරු 10.30 ට මහනුවර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරන ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර්කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

7 ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති 6 කට නොඅඩු කාලයක් තුළ සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර මහනුවර මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකතැනගෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් සම්බන්ධ ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

9. වැඩය භාරගන්නා කොන්ත්‍රාත්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියළුම සේවකයින් ලාංකිකයින් වියයුතුවා පමණක් නොව, වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩෙහි යෙදවීමට කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන් හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නො පිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවූ හෝ සේවකයින් වැඩෙහි යෙදවීම තහනම් ය.

යූ ඩී. අයි. සිරිසේන,
මධ්‍ය ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

වර්ෂ 1964 ක්වූ ජනවාරි මස 1 දින,
මහනුවර, අධ්‍යාපන කාර්යාලයේදී ය.

1-259/2—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජනවාරි මස 31 වැනි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ—

| පාසලේ නම | කළ යුතු වැඩ |
|---|---|
| 1. බ/ඇත්තලගෙදර තක්ෂිලා සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 2. බ/ගලහගම සි. මි. පාසැල ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 3. බ/උඩුබාදන සි. මි. පාසැල ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 4. බ/හත්කිඳ සි. මි. පාසැල ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 5. බ/මැදවෙල මහා විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ලක් |
| 6. බ/මිරහවත්ත සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 7. බ/කොස්ගොල්ල සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 8. බ/මහවත්තේගම සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 9. බ/කරගහඋල්පොත සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 10. බ/කෝට්ටගොඩ සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |
| 11. බ/පිල්පොල—ගොඩේගම සි. මි. පාසැල | පාසැල් ගොඩනැගිල්ලක් |

**සංලක්ෂ්‍යය :** බ=බදුල්ල

2. මේ වැඩ සම්බන්ධයෙන් අධ්‍යාපන හා රජයේ වැඩ දෙපාර්තමේන්තුවල ලියා පදිංචි වී ඇති අයට වර්ෂ 1964 ජනවාරි මස 30 වෙනි ගුරු දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙනු ලැබේ.

බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර තැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ, ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනයද, වැඩයේ නමද ලියා තිබිය යුතුයි.

7. වර්ෂ 1964 ජනවාරි මස 31 වෙනි දින පස්වරු 2.30 ට, බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් විවෘත කරණ විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරණ ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් එක් එක් ටෙන්ඩරයේ ගාස්තු ප්‍රමාණයද ටෙන්ඩර් කරුගේ නමද පැමිණ සිටින අයට ඇසෙන සේ කියවනවා ඇත.

8. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබූ අවසාන දින සිට සති හයකට නොඅඩු කාලයක් තුල සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර බණ්ඩාරවෙල සහකාර අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත හැකි අතර ටෙන්ඩර් සම්බන්ධයෙන් ද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. වැඩය භාරගන්නා කොන්ත්‍රාත් කරු විසින් සේවයෙහි යොදවනු ලබන සියලුම සේවකයින් ලාංකිකයින් විය යුතුවා පමණක් නොව වැඩය කෙරෙන ප්‍රදේශයෙන්ම තෝරා ගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. ලාංකිකවූ හා වැඩය කෙරෙන ප්‍රදේශයෙහි වූ සේවකයින් පමණක් වැඩයෙහි යෙදවීම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසියක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගෙන් සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසර දෙනු ලබන විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසිය නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කල සේ සලකනු ලැබීමටද කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. එවැනි අනුමැතියක් හෝ අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ වැඩය කෙරෙන ප්‍රදේශයෙහි නොවන සේවකයින් වැඩයෙහි යෙදවීම තහනම්ය.

බී. පී. ඇම්. සේනානායක,<br>
ඌව ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක.

1964 ජනවාරි මස 4 වැනි දින,<br>
බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

1–328/2—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1964 ජනවාරි 31 වැනි සිකුරාදා පෙරවරු 10.30 වන තෙක් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ:—

| පාසලේ නම | කළයුතු වැඩ |
|---|---|
| 1. මා/අලකොලඹ සි: මි: පා: | ගුරුනිවස. |
| 2. මා/මැටිහක්ක සි: මි: පා: | ගුරුනිවස. |
| 3. මා/වෙලන්ගහවත්ත සි: මි: පා: | ගුරුනිවස. |
| 4. මා/නිකුලබිබිල සි: මි: පා: | ගුරුනිවස. |
| 5. මා/කිරලගොල්ල සි: මි: පා: | අළුත්වැඩියාව. |

අංක : 1 සංලක්ෂය :—මා=මාතලේ දිස්ත්‍රික්කය.

අංක 2 අවශ්‍ය ලියාපදිංචි කිරීම.

| | අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව | අනුමත කළ සමිති සමාගම් |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| අංක 1 සිට 4 | 15,000.00 | 15,000.00 |
| අංක 5 | 5,000.00 | 5,000.00 |

2. ඉහත දැක්වෙන දෙවැනි සටහනේ ප්‍රකාර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට සහ ඊට නොඅඩු ගණනකට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වී සිටින, අනුමත කරණ ලද විවිධසේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති සහ කම්කරු සමුපකාර සමිති වලට ඉහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1964 ජනවාරි මස 30 වැනිදා දවල් 12 වන තුරු නිකුත් කරණු ලැබේ.

3. ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ කාර්‍යාලයේ ඒ සී ශාඛාවේ හෝ කොළඹින් පිට ඕනෑම දිසාපති කාර්‍යාලයක අංක 1 සිට 5 වැඩ සඳහා රුපියල් 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් මාතලේ අධ්‍යාපන නිලධාරි තුමන් වෙත ඉදිරිපත් කළ අයට පමණකි. චෙක්පත්, මුදල් ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍රය කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ මාතලේ අධ්‍යාපන නිලධාරි තුමාගෙන් හෝ ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවැනි ඡේදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

5. පූර්වෝක්ත දෙවැනි ඡේදයේ සඳහන් වන පරිදි අධ්‍යාපන නිලධාරි තුමාගෙන් ලබාගත් ටෙන්ඩර් පෝරම එවිය යුත්තේ දෙවැනි පිටපතකුත් සමඟය. සියළුම විස්තර සහ තොරතුරු මාතලේ අධ්‍යාපන නිලධාරි තුමන්ගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා වෙත ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ප්‍රාදේශීය ටෙන්ඩර් කරුවන් විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේ කාර්‍යාලය සහකාර නිලධාරි තැනට භාරදී එසේ භාරගත් බවට එකෙණෙහිම ලියවිල්ලක් ලබාගත යුතුය. එසේ භාර දෙන ටෙන්ඩර් පත්‍ර බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය.

6. 1964 ජනවාරි මස 31 වැනි දින පෙරවරු 10.30 ට මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරුණු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට විවෘත කරණු ලබන ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරුණු ලබන නිලධාරි තැන විසින් ගාස්තු ප්‍රමාණයද, ටෙන්ඩර් කරුවන්ගේ නම්ද, පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

7. ටෙන්ඩර් කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කර සති හයකට නොඅඩු කාලයක් තුල ස්වකීය ගණන් යෝජනාව විවෘතව තැබිය යුතුයි.

8. වෙනත් අවශ්‍ය විස්තර මාතලේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂාකර බැලිය හැක.

9. තෝරා ගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේම කම්කරුවන් පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරණු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරුණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂක වරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකලා සේ සලකනු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවලංගු කරණු ලැබීමටද යටත්වේයි. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන පෙදෙසේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩී. එම්. වෙලගෙදර,<br>
මාතලේ අධ්‍යාපන නිලධාරි.

1964 ජනවාරි 2 වැනි දින,<br>
මාතලේ අධ්‍යාපන කාර්‍යාලයේදීය.

1–229—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා** .—වර්ෂ 1964 මාර්තු මස 1 වෙනිද සිට 1964 සැප්තැම්බර් මස 30 වැනිද දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන, ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථාන වලට පිරිසිදු එළ කිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම** .—මෙහි උපලේඛන යෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100 ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර** .—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියා යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කාර්යාල වලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර** .—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තු වක් නොදරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට යතුවූ සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්** .—සැපයිය යුතු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම** .—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙක කින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරී කොළඹ" කියා එවිය යුතුයි. සීල් කරණ ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙලවරේ ටෙන්ඩර කරුගේ නම සහ ලිපිනය, පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැකිය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය** .—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර්පත් විවෘත කිරීම** .—ටෙන්ඩර්පත් විවෘත කිරීම කරණ වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරණ ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරණ ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයේ සඳහන් කරණ ලද මිළ ගණන් වලංගු කාල සීමාව** .—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරණ ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

9. **තැන්පත් මුදල්** .—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි** .—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරකරුවෙකු වීමට බලා පොරොත්තු වන්නේ එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේ ය.

11. **වෙනත් විස්තර** .—තව දුරටත් විස්තර දනගැනීම සඳහා දෙවන ඡේදයේ සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එල්. ආර්. ජේ. වොට්සන්,
සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ, 1964 ජනවාරි 2 වැනි දින දී ය.

### උපලේඛනය

#### කොළඹ—කොට්ඨාශය

| 1<br>සේවය | 2<br>ප්‍රදේශය | 3<br>යැවිය හැකි ප්‍රමාණය | 4<br>අවසාන දිනය |
|---|---|---|---|
| 1. කැළණියේ කාර්යභාර නිළධාරී තැනගේ කාර්යාලයේ සිට සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථාන වලට ගෙන යාමට | කැළණිය | 36,000 ... | 1964.2.6 පෙ.ව. 10ට |

1-1158—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට රාත්තල් 80වේ රේල් පීලි සහ ඈම්ණීම් සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර, ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් (ලිපිනය 420 කාමරය, 1වැනි තට්ටුව, මහ ලේකම් කාර්යාලය, කොළඹ 1) 1964 අප්‍රේල් මස 8 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ ක්‍රියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත් ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධ ලියකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාල යෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1964 අප්‍රියෙල් මස 4 වැනි සෙනසුරාදා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

1964 අප්‍රියෙල් මස 8 වැනි බදාදා පෙරවරු 11.05ට අමාත්‍යාංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1964 ජනවාරි මස 3 වැනි දින,
කොළඹදීය.

1-306—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය

### ගෝනි සහ විනිලොන් මැහුම් නූල් සැපයීම

කන්තලේ සීනි කර්මාන්ත ශාලාවට පහත දැක්වෙන ද්‍රව්‍යයන් සැපයීම සඳහා කොළඹ 2, නම්වර 48, ශ්‍රී ජිනරතන පාරෙහි පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයෙහි සභාපති විසින් 1964 ජනවාරි මස 22 වෙනි බදාදා පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

1. ගෝනි—යුනියන්හි මසනු ලද ඒව්විල් හොණ්ඩර 2, සීනි පිර වීම සඳහා රාත්තල් 2 5/8 බරැති අළුත් සීනි ගෝනි--ගෝනි 100,000.
2. යන්ත්‍ර මාර්ගයෙන් සීනි ගෝනි මැසීමට සුදුසු විනිලොන් මැහුම් නූල් 20×2×3 කෝතු 500.

ආපසු ලබාගත හැකි රු. 250ක මුදලක් තැන්පත් කිරීමෙන් කොළඹ 2, නම්වර 48, ශ්‍රී ජිනරතන පාරෙහි පිහිටි ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්, පිටපත් දෙකක් සමග ඉදිරිපත් කළ යුතුය.

21.1.64 වෙනි දින පස්වරු 4.30 දක්වා ටෙන්ඩර් පත් බෙදනු ලැබේ. අවශ්‍ය වෙනත් තොරතුරු ලේකම් වෙතින් ලබා ගත හැක.

සභාපති.

ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය,
48, ශ්‍රී ජිනරතන පාර.
කොළඹ 2.

1-332—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය

වාලච්චේනෙහි කඩදාසි කම්හලට පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටැන්ඩර්, පත්‍රිකා කැඳවනු ලැබේ.

පිෂ්ට (ස්ටාච්) ටොන් 30 (දිය)

1964 පෙබරවාරි 11 දින පූ. භා. 2ට ටැන්ඩර් වසනු ලැබේ. ටැන්ඩර් පත්‍රිකා සහ මෙයට අදාල අනිකුත් විස්තර ඉල්ලුම් කළ විට ලබා ගත හැක.

සභාපති,
නැගෙණහිර කඩදාසි කර්මාන්ත ශාලා සංයුක්ත මණ්ඩලය.

63.12.31,
70, යෝක් වීදිය,
කොළඹ 1.

1-337—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

අවිස්සාවේල්ල දෙවෙනි ශ්‍රේණියේ ඩිපෝවේ පාරවල් හා අංගනයන් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහිවූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1964රේ ජනවාරි මස් 29 වෙනි බදාදා පෙ. ව. 10 වනතෙක් භාරගනු ලැබේ. වැඩි විස්තර බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගෙන් ලබාගත මැනවි.

රුපියල් 40,000ක් හා ඊට වැඩියෙන් යන කර්මාන්ත සඳහා ලංකා ගමනාගමන මණ්ඩලයේ සහ ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ලියා-පදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ඔවුන්ගේ සහතික පත්‍ර ආදිය පරීක්‍ෂාකර බැලීම පිණිස බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඒ සහතික පත්‍ර ආදිය ඉංජිනේරු මහතා අනුමත කළහොත් ටෙන්ඩර් කරුවා විසින් කොළඹ 5, කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි පිටින ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත රුපියල් 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කළ යුතුයි. තැන්පත් කළ මුදල වෙනුවෙන් ලැබුණ කුවිතාන්සිය නියෝජ්‍ය ප්‍රධාන (සිවිල්) ඉංජිනේරු මහතාගේ කාර්යාලයට ඉදිරිපත් කළ විට ඒ මහතා විසින් 1964රේ ජනවාරි මස 25 වෙනි සෙනසුරාදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම පත්‍ර දෙනවා ඇත.

ලංකා ගමනාගමන මණ්ඩලයෙන් සපයන ටෙන්ඩර් පෝර්ම වල ලියා ඉදිරිපත් කරන ටෙන්ඩර් පමණක් පිළිගනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1963 නේ දෙසැම්බර් මස 31 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ නාරාහේන්පිට
200 වෙනි ස්ථානයේදිය.

1-1305—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ගම්පහ රෝහලේ බාහිර රෝගීන්ගේ බෙහෙත්හල සහ චිකිත්සාගාරය දුලුල් කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ හා තැපැල් පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1964 පෙබරවාරි මස 19 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. වේයන්ගොඩ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැළැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1964 ජනවාරි මස 24 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,70,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළහැකිය.

වී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ,
කාර්යාලයේදීය, 1964.1.6.

1-343—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

# තීරණය කල ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාගී දෙපාර්තමේන්තුව

### මඩ සුද්ද කිරීමේ යන්ත්‍රයක් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

ටෙන්ඩර් ප්‍රතිඵල

| ලැබුණු ටෙන්ඩර් ගණන | | ප්‍රතිඵල |
|---|---|---|
| (8) අටයි | ... | සියළුම අයදුම් පත් ප්‍රතික්ෂෙප කරණ ලදී. |

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 7, 1964 ජනවාරි 3 දින.

ඇන්. පෙරියතම්බි,
වාරිමාගී අධ්‍යක්‍ෂ වෙනුවට.

1-291—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

**1963 දෙසැම්බර් මස 1 වන දින සිට අවුරුද්දක් තලෙයිමන්නාරම්හි පොලිස් නිරෝධායන කඳවුරෙහි රඳවා සිටින නීති විරෝධී ලෙස මෙරටට පැමිණියවුන්ට පිසන ලද ආහාර සැපයීමේ ටෙන්ඩර් ප්‍රතිඵල :**

(අ) ලැබූ මුළු ටෙන්ඩර් ගණන :— ... ... 1

(ආ) තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම :— එස්. මුරුගේසු මහතා, කලාපූම්, කරෙයිනාගර්

| (ඇ) පිළිගත් ප්‍රමාණය :— | එක් අයෙකුගේ ප්‍රමාණය | රු. | ශ. |
|---|---|---|---|
| (i) (අ) උදේ තේ | ... ... | 0 | 20 |
| (ආ) දවල් කෑම | ... ... | 0 | 45 |
| (ඇ) හවස තේ | ... ... | 0 | 05 |
| (ඈ) රාත්‍රී කෑම | ... ... | 0 | 38 |
| | දිනකට එක් අයෙකුට ... | 1 | 08 |
| (ii) ලෙඩුන්ගේ ආහාරය : දිනකට ... | ... | 0 | 40 |

වී. පරමනාන්තන්,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1963, දෙසැම්බර් 31 දින.

1–195—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## පිළිගන්නා ලද ටෙන්ඩර් පිළිබඳ විස්තර

| අංකය | වැඩ විස්තරය | ලැබුණු ටෙන්ඩර් ගණන | පිළිගත් අඩුම ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් අඩුම ටෙන්ඩර් කරුගේ ගණන රු. ශ. |
|---|---|---|---|---|
| (1) | මකුල්කැලේ වැව—ප්‍රධාන ඇලෙන් යන අංක 1 හා 4 දරණ කෙත් ඇලවල්වල පස් වැඩ | 2 | ... ඇම්. ඩී. ජී. ගුණවර්ධන ... | 10,901 09 |
| (2) | මකුල්කැලේ වැව—ප්‍රධාන ඇල හා අංක 5 සිට 9 දක්වා වූ කෙත් ඇලවල්වල පස් වැඩ ... | 1 | ... ඇම්. ඩී. ජී. ගුණවර්ධන ... | 8,067 67 |
| (3) | මින්නේරිය ව්‍යාපාරය—4 වන පියවර—5වෙනි යාය—ඩී/31 හි වම් ඇල අංක 1 හි කෙත් ඇල අංක 3 හා 4 හි පස් වැඩ ... ... | 1 | ... කේ. ජී. සලා ... | 11,573 0 |
| (4) | මින්නේරිය වැව් බැම්මේ උඩුපැත්තේ කොන්ක්‍රීට් ලැලි අල්ලන ලද කොටස් අළුත් වැඩියා කිරීම ... ... ... | 2 | ... ඩබලිව්. ඩී. විජේරත්න ... | 4,725 0 |

ක්‍රිස්ටෝෆර් පීරිස්,
ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන.

1963 දෙසැම්බර් මස 27 වැනි දින,
පොලොන්නරුවේ ප්‍රාදේශීය වාරිමාර්ග කාර්‍යාලයේ දීය.

1–233—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීම

පහත උපලේඛණයෙහි සඳහන් වන පළමු, දෙවන හා තුන්වන පන්තීන්ට අයත් කඳන් හා ඉරන ලද දැවද, කැලෑ අපරාධයනට අයත්දේද, උතුරු මධ්‍යම දිශාව භාර කැලෑ නිළධාරි විසින් පහත උපලේඛණයෙහි දක්වා ඇති දිනයන්හි නියමිත වේලාවන්හිදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරනු ලබන දේ ඒ ඒ කොට්ඨාශය හෝ ගබඩාව භාර නිළධාරිගේ අවසරය ඇතිව කලින් පරීක්ෂාකර බැලිය හැකිය.

2. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට යන දේ ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන් එම වෙන්දේසිය අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලවනසේ ක්‍රියා කළ යුතුය. ඒ ඒ වෙන්දේසියට අයත් දේ ඇති ස්ථාන හා අවශ්‍ය වෙනත් සියලුම විස්තර ඒ ඒ කොට්ඨාශය හෝ ගබඩාව භාර නිළධාරීන්ගෙන් හෝ ත්‍රිකුණාමළයේ දිශාභාර කැලෑ නිළධාරියාගේ කාර්‍යාලයෙන් පැමිණ ලබාගත හැක.

ජ. ආ, ද සිල්වා,
දිශා කැලෑ නිළධාරි (උතුරු මධ්‍යම දිශාව).

1963 දෙසැම්බර් මස 20 වන දින,
ත්‍රිකුණාමලයේ,
දිශා කැලෑ කාර්‍යාලයේදීය.

| කොට්ඨාශය/ගබඩාව | වෙන්දේසිය පවත්වන ස්ථානය හා ලිපිනය | තොග ගණන | වෙන්දේසිය පවත්වන දිනය හා වේලාව |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය ගබඩාව ... | රජයේ දැව ගබඩාව, ඇතුළු වරාය පාර, ත්‍රිකුණාමලය | ඉරූ දැව තොග 8 යි ... | 1964 ජනවාරි මස 20 වන දින පෙරවරු 10.00 ට |
| ත්‍රිකුණාමලය අඩවිය ... | අඩවිය කැලෑ කාර්‍යාලය, ත්‍රිකුණාමලය ... | කඳන් හා ඉරූ දැව අඩංගු තොග 19 යි ... | 1964 ජනවාරි මස 20 වන දින පෙරවරු 11.00 ට |
| කහටගස්දිගිලිය අඩවිය ... | අඩවි කැලෑ කාර්‍යාලය, කහටගස්දිගිලිය ... | කඳන් තොග 6 ක් හා කැලෑ අපරාධ උපකරණ තොග 1 ක් | 1964 ජනවාරි මස 21 වන දින පෙරවරු 10.00 ට |
| තලාව අංක. 1 ගබඩාව ... | මධ්‍යම ඉරුම්හල් අංක 1 තලාව ... | කඳන් තොග 5 යි ... | 1964 ජනවාරි මස 22 වන දින පෙරවරු 10.00 ට |

1–336—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

### සේවයට අයෝග්‍ය ටයර් ප්‍රසිඩ වෙන්දේසියේ විකිණීම

**රාජකීය ලංකා නාවික හමුදාව**

1964 ජනවාරි මස 17 දින පෙ. ව. 10ට කොළඹ, ගල්බොක්ක පාරේ පිහිටි වැඩ අංශයේදී සේවයට අයෝග්‍ය ටයර් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විකුණනු ලබන ටයර් ජනවාරි මස 16 දින වැඩ කරන වේලාව තුළදී පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ ගණන ගෙවීම අවශ්‍යවේ.

මිලදී ගත් විෂයයන් එදින ප. ව. 3ට පෙර ඉවත් කර ගත යුතුවේ.

නාවිකාධිපති.

1–324—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

## විවිධ දැන්වීම්

### ප්‍රසිද්ධ වෙන්දේසිය

**කරවිල හේනේ ඉඩම විකිණීම**

සීංගිරි බණ්ඩා හේරත් රණවීර මහතා විසින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත ලියා අත්සන් කර පවරා ඇති ඇටෝර්නි බලපත්‍රයේ කොන්දේසි අනුව මා වෙත පැවරී ඇති බලතල අනුව, මාතලේ ඉඩම් ලේකම් කාර්යාලයේ නීත්‍යානුකූල ලේඛනයක් ලෙස, ඒ ඇටෝර්නි බලතල ලියා පදිංචි කරනු ලදුව, පහත උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම, නාඋල, මාතලේ උතුරේ, ආදායම් පාලක නිලධාරීයාගේ කාර්යාලයේදී. 1964 පෙබරවාරි මස 8 වැනි සෙනසුරාදා පෙරවරු 10ට ආරම්භව, මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. ඉඩමට අදාළ ඔප්පුව, නාඋල, මාතලේ උතුරේ, ආදායම් පාලක නිලධාරීගේ කාර්යාලයේදී වැඩ කරන ඕනෑම දිනකදී පරීක්ෂා කළ හැකිවේ. අයිතිය පිළිබඳ ඔප්පු, වෙන්දේසි ගාස්තු, පැවරුම් ඔප්පුව ලිවීම, මුද්දර ගාස්තු සහ නොතාරිස් ගාස්තු ආදිය, සාර්ථක ඉල්ලුම්කරු විසින් ගෙවිය යුතුවේ.

3. සාර්ථක ඉල්ලුම්කරු විසින් විකුණුම් මිලෙන් 1/5ක් වහාම තැන්පත් කළ යුතුවේ. විකුණුම් මිලේ අගයෙන් සම්පූර්ණ ශේෂ මුදලත්, විකිණීමට අදාළ වියදම් සියල්ලත්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් විසින් සාර්ථක ඉල්ලුම්කරුගේ ඉල්ලුම පිළිගත් බව, ඔහු වෙත දැන්වූ දින සිට මාසයක් ඇතුළතදී ගෙවිය යුතුය. මෙය ඉටු නොවුවහොත්, තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

### සඳහන් කර ඇති ඉඩමේ උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු කොට්ඨාශයේ වගපනහ උඩසිය පත්තුවේ කරවිලගේන වසමේ පිහිටි "කවුපිලන්නාවෙල" කියන අක්කර එකකුත්, රූඩ් දෙකකුත් පර්චස් දහතුනක් විශාල (අ. 1, රූ. 2, ප. 13) පී. පී. අංක ඇස් 18755යේ ලොට් අංක 302 දරණ ඉඩමට මායිම්:—උතුරට: අඩිපාරේ රක්ෂිත ඉඩම; නැගෙනහිරට: පාරකට වෙන්කර ඇති රක්ෂිත ඉඩම; දකුණට: ලොට් අංක 305 දරණ ඉඩම සහ බස්නාහිරට: ලොට් අංක 300 දරණ ඉඩම යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩම සහ ඊට අයිති ගහකොළ පළතුරු ආදී සියළු දේත්ය.

කූ. බාලසිංහම්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1963 දෙසැම්බර් මස 26 වෙනිදා,
මහා භාණ්ඩාගාරයේ දීය.

1–215—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

### ඉංග්‍රීසි නව නීති වාර්තා සංග්‍රහය—නව ගාස්තු

නවනීති වාර්තාවේ දායක මුදල් සහ එහි කොටස්වල මිල ගණන් වෙනස් කිරීම් මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | මෙරට | පිටරට |
|---|---|---|---|---|
| | | | රු. ශත | රු. ශත |
| 1. | නවනීති වාර්තාවේ 66 වෙනි වෙළුම සිට දායක මුදල් | ... | 27 00 | 28 00 |
| 2. | 65 වැනි වෙළුමේ සිට එක් කොටසක මිල | ... | 1 00 | — |
| | 64 වැනි වෙළුම දක්වා එක් කොටසක මිල | ... | 75 | — |
| 3. | සම්පූර්ණ වෙළුමක් (නොබඳින ලද) 1963-11-18 වැනි දින සිට... | | 25 00 | — |

අංක 12.562 හා 1961.7.28 වැනි දින දරන ගැසට් පත්‍රයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂක විසින් කරන ලද නිවේදනය ඉහත සඳහන් අන්දමට සංශෝධන වෙනවා ඇත.

ඇස්. බී. සේනානායක,
ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

1–339—64.1.10 දින අංක 13,913 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි